DTET/14/07/03/2023 2023.09.

කළමනාකරු,

.........................................

**<u>2023/2024 වර්ෂයට ආරක්ෂක සේවය ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල 09ක් හා කාර්මික විද්‍යාල 29ක් සඳහා 2023/2024 වර්ෂයට පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

02. අවශ්‍ය වන්නාවූ ආරක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් සංඛ්‍යාව පිළිබඳ විස්තර හා සේවා මුරය පිළිබඳ කොන්දේසි සහිත උප ලේඛන මේ සමඟ අමුණා ඇත.

03. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සියළුම පරිශ්‍රයන් සඳහා මිලගණන් ඉදිරිපත් කළ යුතු අතර කොටසක් සඳහා ඉදිරිපත් කරන ලංසු මිලගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුද්‍රා තැබූ මිලගණන් **2023.10.09 දින පෙ.ව.10.30 පෙර අධ්‍යක්ෂ (තාක්ෂණ සහාය සේවා) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ සැපයුම් අංශයේ තබා** ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. **2023.10.09 දින පෙ:ව:10.30ට පසු ලැබෙන මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු** ලැබේ.

04. ආපසු නොගෙවන රු.12,500/=ක මුදලක් **2023.09.15- 2023.10.05** දින දක්වා සතියේ ඕනෑම වැඩකරන දිනයක පෙ.ව.9.30 සිට ප.ව. 2.30 දක්වා අතර කාලය තුළ දී මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා අදාළ රිසිට්පත තාක්ෂණික සහාය සේවා අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ ටෙන්ඩර් ලියවිලි ලබාගත හැකි අතර එහි ඇති **ඉල්ලුම් පත්‍රය මගින් පමණක් මිලගණන් ඉදිරිපත් කළ යුතු ය**. එසේ නොවන මිලගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. විකල්ප ලංසු ඉදිරිපත් කිරීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

06. රු.**502,000/=** ක ලංසු සුරක්ෂණය මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල් නමට **2023.10.10** දින සිට දින 120ක් සඳහා වලංගු වන පරිදි (**2023.10.10 - 2024.02.06**) ඉදිරිපත් කල යුතුය. (ලංසු සුරක්ෂණය මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව ඉදිරිපත් කල යුතුය. එසේ නොවන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**අධ්‍යක්ෂ(තාක්ෂණික සහාය සේවා)**
**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ.557, ඕල්කට් මාවත,කොළඹ 10.**
**දුරකථන අංකය : 011 2327008 / ෆැක්ස් අංකය : 011-2424977**

**ඒ.ඒ.ඩී. ලීලාරත්න**
අධ්‍යක්ෂ(තාක්ෂණික සහාය සේවා)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

DTET

DTET

# ආරක්ෂක සේවය සැපයීමේ කොන්ත්‍රාත්තු ගිවිසුම

එක් පාර්ශවයකට මෙහි මින් පසු පළමු පාර්ශවය යැයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ **කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එස්.සී. ජගත්** යන අය හා ඔහුගෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් වන අය ද, අනෙක් පාර්ශවයට කොන්ත්‍රාත්කරුයයි කියනු ලබන අංක ........................................................................................ සමාගමෙහි කළමණාකාර අධ්‍යක්ෂ ........................................................................................ (හැඳුනුම්පත් අංක ......................................) යන අය ද ඔහුගේ ඇවෑමෙන් එම තනතුරට පත්වන අය ද, එකී සමාගම හා එම සමාගමේ අනුප්‍රාප්තිකයින් දෙවන පාර්ශවයට ද, බැඳි එකී දෙපාර්ශවය අතර **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, ගබඩාව හා නඩත්තු අංශය පිහිටි පරිශ්‍රය, මරදාන, ගාල්ල, අනුරාධපුර, මහනුවර, රත්නපුර, කුරුණෑගල, යාපනය, බදුල්ල, අම්පාර යන තාක්ෂණ විද්‍යාල සහ ඇඹිලිපිටිය, ආනමඩුව, බලපිටිය, බණ්ඩාරවෙල, මඩකලපුව, බෙලිඅත්ත, ගම්පහ, හෝමාගම, කළුතර, කෑගල්ල, කුලියාපිටිය, මන්නාරම, නුවරඑළිය, රත්මලාන, සම්මන්තුරේ, මැදගම, වවුනියාව, දඹුල්ල, පොළොන්නරුව, දෙහිඅත්තකණ්ඩිය, මොණරාගල, පාතදුම්බර, වරකාපොළ, වාරියපොළ, මාතලේ, වීරවිල, අක්කරපත්තුව, හසලක සහ මාතර** යන කාර්මික විද්‍යාලයන්හි දේපල සහ පරිශ්‍රයන් ආරක්ෂා කිරීම සඳහා වූ පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම සඳහා පහත සඳහන් ගිවිසුම හා කොන්දේසිවලට යටත්ව 2023 නොවැම්බර් 15 සිට 2024 නොවැම්බර් 14 දින **(කොන්ත්‍රාත්තුව පිරිනමන දින සිට වසරක කාලයක්)** දක්වා වූ කාලය තුළ ආරක්ෂක සේවා කටයුතු සම්බන්ධයෙන් වර්ෂ 2023ක් වූ ....................මස වන දින කොළඹ 10, ඕල්කට් මාවතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ලියා අත්සන් කරන ලද ගිවිසුමයි.

ඉහත කී ගිවිසුම හා කොන්දේසි කවරේද යත්,

01. කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම වර්ෂයකට බදු රහිතව රුපියල් .................................. ........................................................................ (රු.........................) වේ. මෙම කොන්ත්‍රාත් මුදල සේවා මුරවල රාජකාරි කරන පැය ගණන සහ යොදවනු ලබන සේවක සංඛ්‍යාව අනුව වෙනස් විය හැකි ය.

02. කොන්ත්‍රාත්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සඳහන් කොන්දේසි හා උපදෙස් පරිදි එකී උපලේඛනයේ සඳහන් කර ඇති සේවාවන් 2023 නොවැම්බර් 15 දින සිට 2024 නොවැම්බර් 14 දින **(කොන්ත්‍රාත්තුව පිරිනමන දින සිට වසරක කාලයක් )** දක්වා කාලය තුළ සාර්ථකව ඉටු කළ යුතු වේ.

03. සේවය අසතුටුදායක නම් හෝ වෙනත් සාධාරණ හේතූන් මත ඕනෑම වේලාවක පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයට මාසයක පූර්ව දැනුම් දීමකින් පසුව සේවය අවසන් කළ හැකිය.

04. මුළු කොන්ත්‍රාත් මුදලින් 10%ක කාර්යසාධන ඇප මුදලක් තැන්පත් කිරීමට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

05. අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරන ලද /නම් කරනු ලබන නිලධාරියෙකුගේ උපදෙස් පරිදි කොන්ත්‍රාත්කරු විසින් සේවාවන් ඉටු කළ යුතුය.



DRAFT

06. ගෙවීම් කටයුතු මෙහි පහත උපලේඛනයේ ' ඈ ' වන ඡේදය අනුව සිදු කරනු ඇත.

07. කොන්ත්‍රාත්තුවට අදාළ සේවා සැපයීමේ දී දෙවන පාර්ශවයේ නොසැලකිල්ල නිසා හෝ තම රාජකාරිය පැහැර හැරීමක් නිසා හෝ රජයේ දේපලක් අස්ථානගත වුවහොත් සහ රජයේ දේපලකට යම් හානියක් සිදු වුවහොත් එම අලාභ වූ දේපලෙහි වටිනාකම දෙපාර්තමේන්තුවට ගෙවීමට දෙවන පාර්ශවය වන කොන්ත්‍රාත්කරු බැඳී සිටීය යුතු ය.

08. ගිවිසුමට පටහැනිව කටයුතු කළහොත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගැනීම නතර කිරීමට පළමු පාර්ශවය වන අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

09. කොන්ත්‍රාත්කරුගේ යම් සේවකයකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් හෝ කම්කරු වන්දි ආඥා පනතේ හෝ වෙනයම් කම්කරු නීතියක් යටතේ කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකීම දැරිය යුතුය. පළමු පාර්ශවය ඒ සම්බන්ධයෙන් වගකීමක් දැරීමට බැඳී නොසිටී.

10. කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන සේවාවන් සතුටුදායක නොවන බව විධිමත් පරීක්ෂණයකින් පසුව අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන්නේ නම් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව කොන්ත්‍රාත්තුව ඕනෑම වේලාවක අවසන් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත. කොන්ත්‍රාත්කරු වෙත ලේඛනගත තැපෑලෙන් ඒ බව දැන්වීම ප්‍රමාණවත් වේ.

11. කොන්ත්‍රාත්කරු විසින් මෙම ගිවිසුම නිසි පරිදි ඉටු කරන බවටත් මෙම කොන්ත්‍රාත්තුව යටතේ තමා විසින් රජයට ගෙවිය යුතු යම් මුදලක් වෙතොත් එම සම්පූර්ණ මුදල ගෙවන බවටත් එකඟ වේ.

12. සේවය අසතුටුදායකවීම හෝ වෙනත් කරුණක් නිසා හෝ දෙපාර්ශවය අතර ඇතිවන ආරවුලකදී එහි බේරුම්කරු ලෙස අමාත්‍යංශ ලේකම් කටයුතු කරනු ඇත .

13. සිසුන්ට මෙන්ම කාර්ය මණ්ඩලයටද කාරුණිකව හා ආචාරශීලිව කටයුතු කළ යුතුය.

ඉහත කී පළමු පර්ශවය වන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් .................................................................. යන අය සහ දෙවන පාර්ශවය වන ..........................................................................................(..........................V) යන අය වර්ෂ දෙදහස් විසි තුනක් වූ ....................... මස ...... දින කොළඹ 10, ඕල්කට් මාවතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දී අත්සන් තබන ලදී.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
| (අධ්‍යක්ෂ ජනරාල්) | (කොන්ත්‍රාත්කරු) |

සාක්ෂි :

| | |
|---|---|
| 01. ...................................... | 01. ...................................... |
| 02. ...................................... | 02. ...................................... |

DRAFT

DRAFT

**<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල 09 /කාර්මික විද්‍යාල 29ක් සඳහා පෞද්ගලික ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම - 2023/2024</u>**

## සේවා සැපයුම් කරුවන්ට අදාළ උපදෙස් හා කොන්දේසි

- උපදෙස්

### 01. <u>මිලගණන් ඉදිරිපත් කිරීම</u>

i. පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර අත්සන් තබන ලද ලංසු ආකෘති පත්‍ර, එක් පිටපතක් මුල් පිටපත ලෙසත්, අනෙක් පිටපත අනු පිටපත ලෙසත් නම් කර වෙන වෙනම කවරවල බහා ඉන් පසුව මුල් පිටපත හා අනු පිටපත වෙන් කර හඳුනා ගැනීමට හැකිවන ආකාරයට නම් කර කවර දෙකම එක කවරයක බහා ඉදිරිපත් කල යුතු ය.

ii. කවරයේ වම් පස ඉහල කෙළවරේ **"ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා ලංසු ඉදිරිපත් කිරීම" 2023/2024** ලෙස සඳහන් කළ යුතු ය.

iii. ලංසු පත් **2023.10.09 දින පෙ.ව. 10.30** ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් නො.557, ඕල්කොට් මාවත, කොළඹ 10 හි පිහිටි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සැපයුම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය .

iv. **2023.10.09 වෙනි දින පෙ.ව.10.30**ට පසු ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් ගැන අධ්‍යක්ෂ ජනරාල් කිසිදු වගකීමකට නොබැඳේ.

### 02. <u>මිල ගණන් විවෘත කිරීම</u>

**2023.10.09** වෙනි දින පෙ.ව.10.30ට ලංසුපත් භාර ගැනීම අවසන්වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. මේ සඳහා ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක. එම අවස්ථාවේදී සියළුම ලංසුපත්වල මිල උපලේඛනය කියවනු ලබන අතර, ලංසුකරුවන්ට එම මිලගණන් සටහන් කර ගත හැකි ය.

### 03. <u>ආරක්ෂක සේවාව සඳහා යෙදවිය යුතු ශ්‍රමිකයන්</u>

ඇමුණුම් අංක 01 හි දැක්වෙන පරිදි විය යුතුය.

### 04. <u>මිල ගණන්වල වලංගු කාලය</u>

ලංසුපත්වල වලංගු කාලය ලංසුපත් භාරගන්නා අවසාන දිනයේ සිට දින 91ක් (2023.10.10-2024.01.08) ක් විය යුතු ය.

### 05. <u>කාර්ය සාධන ඇපකරය සහ ගිවිසුම්ගත වීම</u>

සේවා සැපයීම සඳහා තෝරාගත් ලංසුකරු එම ලිපිය ලැබීමෙන් දින 14ක් තුළ දී පිළිගත් බැංකුවකින් කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමෙන් 10% ක මුදලකට සමාන කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කල යුතු අතර ඉන් පසු කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය.

## 06. <u>කොන්ත්‍රාත් මුදල</u>

කොන්ත්‍රාත්තුව සඳහා වැට් බදු අය කරන්නේනම් වැට් බදු අංකය සහිතව ලංසුවේ ශුද්ධ වටිනාකම සහ හිමිකම් ඉල්ලනු ලබන වැට් බද්දේ වටිනාකම වෙන වෙනම මිල ගණන් ඉල්ලුම් පත්‍රයේ ඇතුලත් කළ යුතුය.

## 07. <u>ලංසු සුරක්ෂණ</u>

රු.**502,000.00ක** ලංසු සුරක්ෂණය මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව අධ්‍යක්ෂ ජනරාල් කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව නමට **2023.10.10 දින සිට දින 120ක් (2024.02.06)** සඳහා වලංගු වන පරිදි ඉදිරිපත් කල යුතුය.(නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලංසු සුරක්ෂණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

- **කොන්දේසි පත්‍රිකාව**

**(අ) <u>ආරක්ෂක සේවාව යෙදවිය යුතු ප්‍රදේශයන්</u>**

- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයට අයත්වන සියලු ම ස්ථානවන ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ බිම් මහලේ සිට තෙවන මහල දක්වා මහල් ද පුහුණු අංශය (ගරාජය, රියදුරු කාමරය, ආරක්ෂක කුටිය, ආපන ශාලාව ද ඇතුළුව) නඩත්තු ඉංජිනේරු අංශය, ගබඩා අංශය පිහිටි පරිශ්‍රය, අම්පාර, අනුරාධපුර, බදුල්ල, ගාල්ල, යාපනය, මහනුවර, කුරුණෑගල, මරදාන හා රත්නපුර යන තාක්ෂණ විද්‍යාල පරිශ්‍රයන් ද එම පරිශ්‍රයන්හි ඇති සියලුම නිශ්චල හා චංචල දේපල ද රත්මලාන, කළුතර, කුලියාපිටිය,ඇඹිලිපිටිය, මඩකලපුව, හෝමාගම, ගම්පහ, මන්නාරම, නුවරඑලිය, ආණමඩුව, මැදගම, කෑගල්ල, බෙලිඅත්ත, බලපිටිය, බණ්ඩාරවෙල, සම්මන්තුරේ, පොළොන්නරුව .වවුනියාව, දඹුල්ල, දෙහිඅත්තකණ්ඩිය, මොණරාගල, මාතර, පාතදුම්බර, වරකාපොළ, වාරියපොළ, මාතලේ, වීරවිල. අක්කරෙයිපත්තුව, හසලක යන කාර්මික විද්‍යාල පරිශ්‍රයන් එම පරිශ්‍රයන්හි ඇති සියලුම නිශ්චල හා චංචල දේපල ද අතිරේක සේවාවන් අවශ්‍ය වූ විට එම සේවාව සැපයීමට ද යටත්ව ඒවාට අයත් සියලු දේපල ද ඊට අමතරව ඒ ඒ විද්‍යාලයන්හි අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් විසින් වෙසෙසින් පවරන ස්ථාන ද වේ.

**(ආ) ආරක්ෂක සේවාව යෙදවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු**

ආ.1. අදාළ භූමියට ඇතුළුවන පිටවන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළු ඕනෑම කෙනෙකුගේ ගමන් මලු හා වෙනත් පාර්සල් අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂාවට ලක් කළ යුතුය.

ආ.2. කාර්යාලීය බැගයට අමතරව කිසියම් විශේෂ යමක් රැගෙන යන්නේ නම් ආරක්ෂක නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් විය යුතුය.

ආ.3. කාර්යාල භූමියට ඇතුළු වන හා පිටවන සියලුම වාහන පිළිබඳව අංක සහිතව ලේඛණයක් පවත්වා ගෙන යායුතුය.

ආ.3.i. එම වාහනවලට සම්බන්ධ රියදුරුගේ නම/ආයතනය සහිතව අනන්‍යතාවය තහවුරු විය යුතුය.

ආ.3.ii.ආරක්ෂක අංශය වෙත භාරගන්නා සියළු ගොඩනැගිලි, රථවාහන හා වෙනත් යතුරු විධිමත්ව කවරයක බහා කිනම් යතුරද යන්න සඳහන් කර තිබිය යුතු අතර, එය භාරගන්නා අවස්ථාවේ අදාළ නිලධාරියාගේ අත්සන, වේලාව හා දිනය ඇතුලත් සටහන් ලේඛණයක් පවත්වාගෙන යායුතුය.

DRAFT

**(ඈ). ආරක්ෂක සේවයේ යෙදවීම පිළිබඳව පොදු කොන්දේසි**

ඈ.1. දවසේ පැය 24 තුල ම ආරක්ෂක සේවාවන් ඉටු කළ යුතුය.

ඈ.2. සේවා කාලය සේවා මුර දෙකකින් ක්‍රියාත්මක කළ යුතුය. (එක් සේවා මුරයක් පැය 12 කට සීමා විය යුතු අතර අඛණ්ඩව පැය 24ක් ලෙස සේවයේ නොයෙදවිය යුතුය. එසේ වුවද ආරක්ෂක සේවය අත්‍යාවශ්‍ය සේවාවක් බැවින් හදිසි අවස්ථාවලදී අවස්ථානුකූලව මෙය වෙනස්විය හැක)

I. පෙ.ව.7.00 සිට ප.ව.7.00 දක්වා හා
II. ප.ව.7.00 සිට පෙ.ව.7.00 දක්වා

එය එසේ වුව ද කාන්තා ආරක්ෂක නිලධාරීන් සඳහා සේවා මුරය පෙ.ව.7.00 සිට ප.ව.5.30 දක්වා අවම වශයෙන් දිනකට පැය 10½ක ලෙස සේවා මුරය ක්‍රියාත්මක වන අතර එය සේවා මුරයක් ලෙස සලකා ගෙවීම් සිදුකරනු ඇත.

ඈ.3. මීට පෙර වර්ෂයේ වෙනත් සමාගම් යටතේ මෙම කාර්යාලයේ සේවයේ යෙදී ඇති සේවකයින් ඔබ ආයතනය යටතේ සේවයේ යෙදවීම කටයුතු කරන්නේ නම්, එවන් අවස්ථාවන්හි දී මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ඈ.4. සේවයේ යොදවා ගන්නා ආරක්ෂක නිලධාරීන් හා නිලධාරිනියන් සිංහල /දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව කථා කිරීමට හා ලිවීමට හැකි අය විය යුතු අතර, සේවයේ අවශ්‍යතාවය මත භාෂාව හැසිරවිය යුතුය.

ඈ.5. සෑම දිනකම, සෑම ආරක්ෂක මුරකුටියකම ආරක්ෂක කටයුතු පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු නිලධාරියකු පැමිණි බවට ලේඛණයක් පවත්වා ගත යුතුය. එසේ නොවන බව වාර්තා වුවහොත් ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියා මාර්ග වලට එකඟ විය යුතුය.

ඈ.6. ආරක්ෂක සේවයේ නියුතු වන නිලධාරියා හෝ නිලධාරිනිය පැමිණිලි පොතේ සටහන් තැබිය යුතු අතර අදාළ ලේඛණ අංශ ප්‍රධානියකු වෙත ඉදිරිපත් කර සහතික කර ගත යුතුය.

ඈ.7. සෑම විටම ආරක්ෂක සේවයේ යෙදෙන නිලධාරියා සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසී නිල හැඳුනුම්පත පැලඳ සිටිය යුතුය.

ඈ.8. සේවයේ යොදවා ගන්නන් නිරන්තරයෙන් වෙනස් නොකළ යුතු අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී එක් එක් දිනයන්හි සේවයේ යොදවන ලද සේවකයින්ගේ අනන්‍යතාවය (නම, ලිපිනය ආදී විස්තර, හැඳුනුම්පත්වල පිටපත්) ඉදිරිපත් කිරීමට සේවා සැපයුම් ආයතනයට හැකි විය යුතුය.

ඈ.9. ආරක්ෂක සේවයේ යොදවන්නන්ගේ හෝ වෙනත් පුද්ගලයකු පිළිබඳව කම්කරු වන්දි ආඥා පනත හෝ වෙනත් කම්කරු නීතියක් යටතේ වූ කිසිදු හිමිකමකට පළමු පක්ෂයට බැඳුණු මෙම දෙපාර්තමේන්තුවේ බැඳීමක් නැත. යොදවන ලද සේවකයින්ට අදාලව ගෙවන අර්ථසාධක අරමුදලින් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් ගෙවීම් පිළිබඳ සියළු වගකීම් ආරක්ෂක සේවා සපයන ආයතනය විසින් දැරිය යුතුය. සේවයේ යොදවන සියලු සේවකයන්ගේ සේවා යෝජකයා වශයෙන් ඇති සියලු බැඳීම් හා වගකීම් ආරක්ෂක සේවය පවත්වාගෙන යන ආයතනය විසින් වග බලාගත යුතුය.

ඈ.10. කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු සේවයේ යෙදවීමට බලාපොරොත්තු වන සේවකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ නම හා ලිපිනය සඳහන් ලැයිස්තුවක් ලබා දිය යුතුය. පසුව යම් වෙනසක් සිදු කිරීමට අවශ්‍ය වෙතොත් මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

DRAFT

ඇ.11. ආරක්ෂක සේවය ඉටු කරන්නන් දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ හෝ අදාළ තාක්ෂණ/කාර්මික විද්‍යාලවල සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලට සහ කාර්යාලයේ හා ආචාර්ය මණ්ඩලයේ හෝ සේවකයකුගේ රාජකාරියට බාධාවක් නොවන අයුරින් ආරක්ෂක කටයුතු සිදු කළ යුතුය.

ඇ.12. ආරක්ෂක සේවකයන්ගේ නොසැලකිල්ල හෝ අතපසුවීම් හේතුවෙන් රජයේ දේපලකට හෝ දෙපාර්තමේන්තු නිලධාරියෙකු හෝ සේවකයකු හට යම් අලාභ හානියක් හෝ පාඩුවක් සිදුවුවහොත් ඒ පිළිබඳ වගකීම දෙවන පාර්ශවය වන එම ආයතනය විසින් දැරිය යුතුය.

ඇ.13. මෙම කොන්දේසිවලට අමතරව රජය විසින් හා/හෝ කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රජය වෙනුවෙන් වරින්වර පවරනු ලබන කොන්දේසි වලට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

ඇ.14. පළමු පාර්ශවයට බැඳුණ දෙපාර්තමේන්තුව විසින් දෙවන පාර්ශවයෙන් ඉටුකරවා ගැනීමට අපේක්ෂිත සේවාවලට අයත් යම් සේවාවක් හෝ කොටසක් යම් අවස්ථාවකදී නිසි පරිදි ඉටු කර නොමැති බැව් පෙනී ගියහොත් ඒ සෑම අතපසු වූ අවස්ථාවක් හෝ දිනයක් සඳහාම ආරක්ෂක සේවය සපයන ආයතනය වෙත ගෙවන මාසික මුදලින් <u>සියයට පහක(5%)</u>ද අඩු කිරීමට යටත් කරනු ඇත.

ඇ.15. ගිවිසගත් සේවාව පැහැර හරින බැව් පෙනී ගිය හොත් කොන්ත්‍රාත්තුව වහාම අවලංගු කිරීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

ඇ.16. ආරක්ෂක නිලධාරීන්ගේ එක් සේවා මුරයක් පැය 12 කට සීමා විය යුතු අතර අඛණ්ඩව පැය 24ක් ලෙස සේවයේ නොයෙදවිය යුතුය. එසේ වුවද ආරක්ෂක සේවය අත්‍යාවශ්‍ය සේවාවක් බැවින් හදිසි අවස්තාවලදී අවස්ථානුකූලව මෙය වෙනස්විය හැක. රජයේ නිවාඩු දිනයන්හි සේවයේ යෙදී සිටින ආරක්ෂක නිලධාරීන් පැය දෙකෙන් දෙකට ඇඟිලි සලකුණු තබා රාජකාරියේ යෙදී සිටින බව තහවුරු කල යුතුය.

ඇ.17. බාල වයස්කරුවන් සේවයේ නොයෙදවිය යුතු අතර සේවයේ යොදවන්නන් අවුරුදු 60ට අඩු මනා ශරීර සෞඛ්‍යයෙන් යුතු අය විය යුතුය.

**(ඈ) ගෙවීම් කටයුතු**

ඈ.1. ඉහත සඳහන් කර ඇති සියලු සේවාවන් වෙනුවෙන් මාසිකව දෙවන පාර්ශව විසින් අය කරනු ලබන මුදල මාසික මිල ගණන් වශයෙන් ඉදිරිපත් කළ යුතු අතර, සේවාව පවරනුයේ **2023 නොවැම්බර් මස 15 දින සිට 2024 නොවැම්බර් මස 14 දින (කොන්ත්‍රාත්තුව පිරිනමන දින සිට වසරක කාලයක් )** දක්වා කාල පරිච්ඡේදය සඳහා වන අතර, එකී කාල පරිච්ඡේදය තුළ ගිවිසුම්ගත මුදලෙහි වෙනසක් සිදු නොවිය යුතුය.

ඈ.2. මාසයක් සේවය ඉටු කළ වහාම අදාළ ගෙවීම් කටයුතු සඳහා දෙවන පාර්ශවය විසින් අදාළ ලියකියවිලි සහිත බිල්පත ඉදිරිපත් කළ යුතුය. එකී බිල්පත ලංසුවෙන් ඉදිරිපත් කළ මිල ගණන්වලට අනුකූල විය යුතුය. ගෙවීම් කිරීමට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් මාසයේ සේවාව නිසි අයුරින් ඉටු කරන ලද බවට සහතික කර තිබිය යුතුය.

DRAFT

ඇ.3. යම් ස්ථානයක නියමිත ආරක්ෂක නිලධාරීන් සේවයෙහි නොසිටියේ නම් ඒ සඳහා වූ මුදල මාසික ගෙවීම්වලින් අඩුකර ගෙවනු ලැබේ.

ඇ.4. ගිවිසුමෙන් දක්වන ලද සේවාවන් යම් දිනකදී දෙවන පාර්ශවය විසින් සතුටුදායක ලෙස නිම කිරීමට අපොහොසත් වුවහොත් මාසික ගාස්තුව ගෙවීමේදී අදාළ ආයතනයේ (තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ) මාසික බිල්පත් වටිනාකමින් සියයට පහක (5%) මුදලක් අඩු කරනු ලැබේ.

ඇ.5. පිරිමි ආරක්ෂක නිලධාරියෙකු තම සේවා මුරය සඳහා පැය 12 ට අඩුවෙන් සේවය කර ඇත්නම් දෛනික දීමනාව අනුව අදාල කාලයට ගැලපෙන්නා වූ ප්‍රමාණයට ගෙවීම්වලින් අඩුකරනු ලබන අතර, කාන්තා ආරක්ෂක නිලධාරිනියක තම සේවා මුරය සඳහා පැය 10 ½ ට අඩුවෙන් සේවය කර ඇත්නම් දෛනික දීමනාව අනුව අදාල කාලයට ගැලපෙන්නා වූ ප්‍රමාණයට ගෙවීම්වලින් අඩුකරනු ඇත.

DTET

**එක් එක් ආයතන සඳහා අවශ්‍ය ආරක්ෂක නිලධාරි /නිලධාරිනියන් සංඛ්‍යාවේ ආකෘතිය - 2023/2024**

| | | ආයතනය | OIC | SSO | LSO | Total |
|---|---|---|---|---|---|---|
| **1** | **දෙපාර්තමේන්තු පරිශ්‍රය** | | 2 | 8 | 1 | 11 |
| **2** | **තාක්ෂණ විද්‍යාල** | | | | | |
| | 1 | මරදාන | 1 | 5 | 2 | 8 |
| | 2 | ගාල්ල | - | 4 | 1 | 5 |
| | 3 | අනුරාධපුරය | - | 4 | 1 | 5 |
| | 4 | මහනුවර | 1 | 3 | 1 | 5 |
| | 5 | රත්නපුර | - | 2 | 1 | 3 |
| | 6 | කුරුණෑගල | - | 4 | 1 | 5 |
| | 7 | යාපනය | - | 2 | 1 | 3 |
| | 8 | බදුල්ල | - | 4 | 1 | 5 |
| | 9 | අම්පාර | - | 4 | 1 | 5 |
| **3** | **කාර්මික විද්‍යාල** | | | | | |
| | 1 | රත්මලාන | - | 4 | 1 | 5 |
| | 2 | කළුතර | - | 4 | 1 | 5 |
| | 3 | කුලියාපිටිය | 1 | 4 | 1 | 6 |
| | 4 | ඇඹිලිපිටිය | - | 2 | 1 | 3 |
| | 5 | මඩකලපුව | - | 2 | 1 | 3 |
| | 6 | හෝමාගම | - | 3 | 1 | 4 |
| | 7 | ගම්පහ | 1 | 3 | 1 | 5 |
| | 8 | මන්නාරම | - | 3 | 1 | 4 |
| | 9 | නුවරඑළිය | - | 2 | 1 | 3 |
| | 10 | ආණමඩුව | 1 | 2 | 1 | 4 |
| | 11 | මැදගම | - | 2 | - | 2 |
| | 12 | කෑගල්ල | - | 3 | 1 | 4 |
| | 13 | බෙලිඅත්ත | - | 2 | - | 2 |
| | 14 | බලපිටිය | - | 3 | - | 3 |
| | 15 | බණ්ඩාරවෙල | - | 2 | 1 | 3 |
| | 16 | සම්මන්තුරය | - | 2 | - | 2 |
| | 17 | පොලොන්නරුව | - | 1 | - | 1 |
| | 18 | වවුනියාව | - | 2 | - | 2 |
| | 19 | දඹුල්ල | - | 2 | - | 2 |
| | 20 | දෙහිඅත්තකණ්ඩිය | - | 3 | - | 3 |
| | 21 | මොනරාගල | - | 3 | - | 3 |
| | 22 | මාතර | - | 2 | - | 2 |
| | 23 | පාතදුම්බර | - | 2 | - | 2 |
| | 24 | වරකාපොල | - | 2 | 1 | 3 |
| | 25 | වාරියපොල | - | 1 | - | 1 |
| | 26 | මාතලේ | - | 2 | - | 2 |
| | 27 | වීරවිල | - | 2 | - | 2 |
| | 28 | අක්කරපත්තුව | - | - | 1 | 1 |
| | 29 | හසලක | - | 2 | - | 2 |
| | | **එකතුව** | **07** | **107** | **25** | **139** |

DTET

## <u>මිලගණන් ඉදිරිපත් කිරීමේ ඉල්ලුම් පත්‍රය</u>

අධ්‍යක්ෂ ජනරාල්,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 10.

**<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල 09 /කාර්මික විද්‍යාල 29ක් සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම - 2023/2024</u>**

1. කොන්ත්‍රාත්කරුගේ නම හා තනතුර :

2. ආරක්ෂක සේවා සැපයීමේ ආයතනයේ නම :

3. ආරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපාර ලියාපදිංචි ස්ථානයේ ලිපිනය :

4. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් සහ ජා.හැ. පත් අංක :

5. ව්‍යාපාර ස්ථානයේ දුරකථන අංකය :

6. 2023 වර්ෂයට වලංගු ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය :
   (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

7. ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ වාර්ෂික බලපත්‍රය :
   (බලපත්‍රයේ පිටපත ඇමිණිය යුතුය)

8. ආසන්න පසුගිය වසර 03ක වාර්ෂික වෙළඳ පිරිවැටුමේ සාමාන්‍ය රු.මි.60ක් විය යුතුය.(පිළිගත් විගණකවරයෙකු විසින් සනාථ කල යුතුය)

9. ඉල්ලුම් කරන ආකාරයේ සේවාවන් පිළිබඳ විස්තර:
   (ආසන්න වසර 05ක් තුළ පිළිගත් රාජ්‍ය/පෞද්ගලික ආයතන වල ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික හෝ ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කළයුතුය.)

10. දැනටමත් සතුටුදායක ලෙස සේවාව සපයන ආයතන අවම වශයෙන් 03ක් හෝ පවතී නම් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. (ලියවිලි වලින් සනාථ කළයුතුය.)

11. සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් ගෙවනවාද යන්න :
    (සනාථ කිරීම සඳහා අදාළ ලියකියවිලි ඇමිණිය යුතුය)

12. පඩි පාලක සභා ආඥා පනත / රජයේ අනුමත නීතිරීති වලට අනුව වැටුප් හා වේතන ගෙවිය යුතුය.

DIET

**12.** **ප්‍රසම්පාදන කොන්දේසි හා උපදෙස් කියවා තේරුම් ගැනීමෙන් පසු 2023.11.15 දින සිට 2024.11.14 දින (කොන්ත්‍රාත්තුව පිරිනමන දින සිට වසරක කාලයක් සඳහා) දක්වා කාල සීමාව සඳහා වැට් රහිතව රුපියල්............................. (RS..............................) මුදලකට ආරක්ෂක සේවාව පහත සඳහන් පරිදි සැපයීමට මෙයින් එකඟ වෙමි / වෙමු.**

- **ඇමුණුම 01 හි සඳහන් සේවක සංඛ්‍යාව අනුව ඇමුණුම 02 හි මිලගණන් ඉදිරිපත් කරන්න.**
- **සේවක පඩිනඩි වලට පරිපාලන වියදම් හා අනෙකුත් වියදම් ඇතුලත් නොකල යුතුය.**

DTET

| | |
|---|---|
| **සියළුම ආයතන සඳහා සම්පූර්ණ එකතුව (මසකට බදු රහිත)** | |
| **VAT** | |
| **සියළුම ආයතන සඳහා සම්පූර්ණ එකතුව (මසකට බදු සහිත)** | |
| **සියළුම ආයතන සඳහා සම්පූර්ණ එකතුව (වසරකට බදු සහිත)** | |

- **මෙම ලංසු දින 91ක (2023.10.10-2024.01.08) කාලයක් සඳහා වලංගු වේ.මෙම වලංගු කාලය තුළදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළහොත් ගිවිසුමකට එළඹීමටත් කාර්ය සාධන ඇපකරයක් ඉදිරිපත් කිරීමටත් සූදානමින් සිටිමි/සිටිමු.**

- **අවම ලංසු භාර ගැනීමට ඔබ බැඳී නොසිටින බවත්, කිසිම හේතුවක් නොදන්වා ලංසු ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇති බවත් මම/අපි දැනගෙන සිටිමි./සිටිමු.**

**ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, අදාළ කොන්දේසි අඩංගු පත්‍රිකාව හොඳින් කියවා බලා ඒ අනුව කටයුතු කිරීමට එකඟ වන බවත් මෙයින් දන්වා සිටිමි.**

**දිනය :** **කොන්ත්‍රාත්කරුගේ නම සහ අත්සන**

**මුද්‍රාව**

**අධ්‍යක්ෂ ජනරාල්**

**……………………………………………………………………………………………………….**

**කුවිතාන්සි අංකය:**

**නිකුත් කිරීමේ නිලධාරී:** **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

DTET

# FORM OF BID SECURITY (BID BOND)

By this Bond ........................................................................................(Hereinafter called "the Bidder") and we (name of bank or insurance company)whose registered office is at '.................... Hereinafter ...................................................................called "the Surety" are held and firmly bound unto ................................................................. here in after called "the Authority" in the sum of ...................................................................... for the payment of which sum the Bidder and the Surety bind themselves their successors and assigns jointly and severally by these presents.

Whereas the Authority has invited the Bidder and other persons to complete bids in similar terms for the supply and installation of ……………………………………… ……………………………………………………………… …………………….. and works associated therewith the(hereinafter called "the works") and to submit the same for the consideration of the Authority, and the Bidder proposes to submit to the Authority a bid (hereinafter called "the Bidder") in accordance with such invitation, the Bond shall provide security to the Authority that the Bidder will honor certain obligations to be undertaken by him in the Bid in accordance with the following conditions.

Now the Conditions of this Bond are:

(a) That it shall remain in full force and effect until the earliest of

(i) (date), being ( ) days from (submission date), the date Stipulated by the Authority for the submission of bids, or any prolongation of such date above notified to the Authority by the Bidder and the Surety in writing.

(ii) in the event of acceptance of the bid by the Authority, the date upon which the Bidder provides a performance security to the Authority in accordance with the terms of the contract thereby made between them, or

(iii) in the event of acceptance by the Authority of a bid for the works from a third party, the date upon which such third party provides the relevant performance security.

(b) Subject to this Bond being in full force and effect, the Surety shall pay the full amount specified in this Bond upon receipt of first written demand from the Authority stating that

(i) the Bidder has withdrawn his Bid during the validity of this Bond, or

(ii) the Bidder has failed to provide a performance security to the Authority in accordance with the terms of the contract between them upon acceptance of the Bid.

No alteration in the terms of the Bid, nor any forbearance or forgiveness in or in respect of any matter or thing concerning the Bid on the part of the Authority, or any objection from the bidder shall in any way release the Surety from a liability under this Bond.

Contd…..2

DIET

The benefit of this Bond shall not be assignable by the Authority and upon its ceasing to be in full force and effect the Authority shall return the same to the Bidder.

This Bond shall be governed by the laws of the Democratic Socialist Republic of Sri Lanka.

I executed as a Deed this () day of ( ) 20 ()

For and on behalf of the Bidder .......... .

Signed by .

In the capacity of .

And by ................................................. .

In the capacity of .................................. .

Seal (where applicable)

For and on behalf of the Surety ................. .

Signed by .

In the capacity of .

And by .

In the capacity of .

Seal (where applicable)

DTET

**FORM OF PERFORMANCE BANK GUARANTEE**

BOND NUMBER ........................................ ........................
DATE ............................................................
SUM GUARANTEED : ..........................................................
To: .......................................................................................................................................
(Name of employer)
……………………………………………………………………………………………
(Address of employer)

Whereas ...................................................................... (name and address of contractor) [hereafter called "the contractor"] has undertaken, in pursuance of contract No …………………… dated .................................. to execute ............................ ……………………………………(name of contract) [hereafter called "the contract"];

And whereas it has been stipulated by you in the said Contract that the Contractor shall furnish you with a Bank Guarantee by a recognized Bank for the sum specified therein as security for compliance with his obligations in accordance with the Contract;

And whereas we have agreed to give the Contractor such a Bank Guarantee;

Now therefore we hereby affirm that we are Guarantor and responsible to you, on behalf of the Contractor, up to a total of …………………………………………………………(amount of Guarantee) (amount in words), such sum being payable in the type and proportions of currencies in which the Contract Price is payable, and we undertake to pay you, upon your first written demand and without cavil or argument, any sum or sums within the limits of …………………………………………..…………………………………….................................
..........................................................................................................................................
(amount of Guarantee) as aforesaid without your needing to prove or to show grounds or reasons for your demand for the sum specified therein.

We hereby waive the necessity of your demanding the said debt from the contractor before presenting us with the demand.

We further agree that no change or addition to or other modification of the terms of the Contract or of the works to be performed there under or of any of the Contract document which may be made between you and the Contractor shall in any way release us from any liability under this guarantee, and we hereby waive notice or any such change, addition or modification.

This guarantee shall be valid until the ........................ day of 2023……

Signature and the Seal of the Guarantor.

.................. …………………………………………………………..

Name of the Bank ......................................................................................

Address ......................................................................................................

Date ..................................................

Witness ......................................................................................................... .

Witness ........................................................................................................ .